මුහුදට ආ වැඩීමක් නොවේ...

මේ ලඟකදී අපේ යාළුවෙක් අපූරු කතාවක් කිව්වා. අළුතෙන්ම මෙහි පදිංචියට ආව ඔහුගෙ යහළු වෛද්‍යවරයක් ගැන. ඒ ඔවුන් මෙහි ආ සැණින්, වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචි වී කටයුතු කරන්නට නොදීම හොඳයි කියනෙකයි. හේතුව වශයෙන් ඔහු සඳහන් කළේ ලංකාවේ වෛද්‍යවරුන් ගෙන් සියයට අනූනවයක්ම වෛද්‍ය වෘත්තියටත් නිගරු ලෙස හැසිරීම සහ මුදල් මුල් කරගෙන කටයුතු කිරීමයි. ලංකාවේ ඉපිද අවුරුදු ගණනාවක් එහිම හැදුණු වැඩුණු මට මෙන්ම ඔබටත් මේ තත්ත්වය අරුමයක් නෙවෙයි. රජයේ රෝහල්වල මෙන්ම පෞද්ගලික රෝහල් වලද වැනල් සේවාවන් තුළද මේ අත්දැකීම් ඔබත් අනන්ත අප්‍රමාණව ලබා ඇතුවාට සැකයක් නැහැ. රෝගීන් ගෙන් අයකර ගන්නා මුදලට සරිලන සේවාවක් ලබාදෙන රෝහලක් හෝ වෛද්‍යවරයෙක් ගැන අසන්නට ලැබෙනවා නම් ඒ බොහෝමත් කලාතුරකින්.

වැනල් සේවයෙන් ලබාදෙන සේවාවට වඩා එය අද ලංකාවේ මහා පරිමාණයේ ලාබ ලබන ව්‍යාපාරයක්, ජාවාරමක් බවට පත්වෙලා. රෝගීන් බොහෝ වෙලාවට හුඟක් අසරණයි. එවන් මානසික පීඩාවන් දරාගෙන ඔවුන් වෛද්‍යවරුන් මුණ ගැසෙන්නේ හිතේ දෙගිඩියාවෙන්. බොහෝ දුර කතර ගෙවා ගෙන හතර අතට

මේ රටවලදී අපි දකින විශේෂත්වය නම් ඕනෑම පුද්ගලයකුගේ කාරුණික බවයි. රෝහලක වුවද පිළිගැනීමේ නිලධාරිනියගේ සිට විශේෂඥ වෛද්‍යවරයා දක්වාද තත්ත්වය එසේමයි.

ණය වී මුදල් සොයාගෙන පාන්දර තුනට හතරට බොහෝමයක් රෝගීන් වැනල් සේවාවල පෝලිම් වලට එකතු වෙන්නේ වෛද්‍යවරුන් විනා අන් පිහිටක් ඔවුනට නැති නිසයි. නමුත් වෛද්‍යවරුන් රෝහල් සේවාවෙන් පසුව වැනල් සේවාවට හැල්මෙ දුවන්නෙ අසරණ රෝගීන් වෙනුවෙන් සද්භාවයෙන් ම නෙවෙයි ඉහවහා ගිය මුදල් තණ්හාවකින් කියලා මට හිතෙනවා. සමහර විට මෙහෙ ඉන්න අපේ වෛද්‍යවරු මා එක්ක එකඟ නොවෙන්නට පුළුවෝ. ඒත් අවංකවම හිතලා බැලුවොත් වෛද්‍යවරුන් වන ඔවුනුත් මේ සිදුවීම් වලට මුහුණ පා ඇති.එහෙම කියන්න තරම් අත්දැකීම් ඕන තරම් මටත් තියෙනවා.

ලංකාවේ සිටියදී වරක් මගේ මවගේ දකුණු උරහිසේ ඇතිවුණු දැඩි වේදනාවක් සම්බන්ධයෙන් මම ඇය සමඟ පවුලේ වෛද්‍යවරයා ගෙන් උපදෙස් පැතූ අවස්ථාවේ ඔහු විසින් අපව අස්ථි රෝග විශේෂඥ වෛද්‍යවරයකු වෙත යොමු කෙරුණා. වැනල් සේවයට මුදල් ගෙවා පැය ගණනක් වෛද්‍යවරයා එනතුරු රස්තියාදු වී රෝගීන් පනහකට පමණ පසුව වෛද්‍යවරයා මුණ ගැසීමට අවස්ථාව ලැබූ අපි එම කාමරයට ගිය විට මම බලාපොරොත්තු වූ රෝගියා පිළිගන්නට, රෝගයේ තතු විමසන්නට සැදී පැහැදී බලා සිටි වෛද්‍යවරයා වෙනුවට එතැන සිටියේ ධාවන තරඟයකට සහභාගි වූ ක්‍රීඩකයෙකුයි. රටේ සුපතල නම ගිය වෛද්‍යවරයෙකු වුව ද ඒ වෙලාවේ ඔහුගේ නියම ස්වරූපය වූයේ එයයි. උරහිසේ වේදනාව ගැන අසමු සැණින් මගේ මවගේ වෘත්තිය ගැන අසමු ඔහු කිසි ලෙසකින්වත් ඇයව පරීක්ෂා නොකොට විශ්‍රාමික ගුරුවරුන් අතර එම වේදනාව සුලබ බවත් හේතුව ඔවුන් පාසැල් කාලය පුරාම කළුලෑල්ලේ ලිවීම සඳහා අත වෙහෙස කරවීම බවත් පවසා එන්නතක් නියම කර එය රැගෙන එන්නත් ලබා ගැනීම සඳහා පෙළ ගැසී සිටින රෝගීන්ට එකතු විය යුතු බවත් පැවසුවා. මේ රෝග විනිශ්චයට හා බෙහෙත් නියම කිරීමට ගත වූ කාලය විනාඩි තුනක් පමණ වුවත් පවුලේ වෛද්‍යවරයා අපට නපුරක් නොකරන බවට පූර්ණ විශ්වාසයක් තිබූ නිසා එම වැනල් සේවාවේම පිහිටි ෆාමසියකින් එන්නත රැගෙන නැවත රෝගීන් අතරට එකතු වුණා.

මගේ මවගේ වාරය පැමිණි විට ඇය සමඟ මා වෛද්‍යවරයා වෙත යාම ප්‍රතික්ෂේප කළ හෙදියකගේ සමාන ඇඳුමකින් සැරසී සිටි යුවතිය මව පමණක් ඇතුළට ගෙන දොර වසා දැමුවද, පිටතින් රැඳී සිට මව එනතුරු බලා නොසිටින්නට තීරණය කළ මම ක්ෂණිකවම දොර ඇර ඇතුළට ගියා. මගේ තීරණය කෙතරම් නිවැරදිද'යි මට පසක් වුණේ රෝගීන් පරීක්ෂා කරන ඇඳේ මව හිඳි කරවා ඇයගේ දකුණු පාදයට එන්නත විදීමට සැරසෙන වෛද්‍යවරයා දුටුවිටයි. එතෙක් වේලාවක් බොහෝ ඉවසීමකින් කටයුතු කළ මගේ ඉවසීමේ සීමාව එතැනදී නම් ඉක්ම ගියා. උරහිසේ අමාරුවකට පාදයට එන්නතක් දීමට තැත්කිරීම සම්බන්ධයෙන් වෛද්‍යවරයාටත්, හෙදියක වෙසින් පෙනී සිටි ඔහුගේ සහායිකාවටත් තදින් මා දෙස් තගද්දී ඔහු දුන් සරලම පිළිතුර වුණේ 'සොරි, කලබලේට වැරදුණා' යන්නයි.

ඕනෑම කෙනෙකු අතින් තව කෙනෙකුට වැරදීම්, අතපසුවීම් සිදුවිය හැකි නමුත්, වෛද්‍යවරයෙකුට වෙන වැරදීම්, අතපසුවීම් සුළු කොට තැකිය හැකි නොවන්නේ එහි ප්‍රතිඵල සෘජුවම බලපාන්නේ අහිංසක රෝගීන් කෙරෙහි වීමයි. එදා අර සහායිකාවගේ බසට කීකරුව මා පිටතින් රැඳී සිටියා නම් මගේ මවට ඇගේ රෝගය සුව කර ගන්නවා වෙනුවට වෛද්‍යවරයාගේ කලබලය හේතුවෙන් භයානක ප්‍රතිඵල අත් විඳින්නට සිදු නොවේ යැයි සිතිය නොහැක්කේ වෛද්‍යවරුන්ගේ කලබලවීම්, අතපසුවීම්, වැරදීම්, නොසලකා හැරීම් නිසා ජීවිතයෙන් වන්දි ගෙවූ හා සඳකාලික රෝගීන් වූ දහස් ගණනක් අහිංසකයින් ලංකාවෙන්ම සොයා ගත හැකි නිසයි. නවු කීමෙන් හෝ වන්දි ලැබීමෙන් හෝ එවැන්නන්ට දඬුවම් දීමෙන් එම වැරදීම් නිවැරදි කර ගත හැකිද? කෙසේ හෝ මවගේ එන්නත නිසියාකාරව ලබා ගැනීමෙන් අනතුරුව පිටතට පැමිණි මා පෙළ ගැසී සිටි රෝගීන්ට වෛද්‍යවරයාගේ 'කලබලයට වන වැරදීම්' ගැන පරීක්ෂාකාරී වන ලෙස අනතුරු හැඟවීමක් කළේ එය මගේ

මේනකා ජයතිලක
ක්වින්ස්ලන්තය

යුතුකමක් ලෙස සලකායි.

මේ රටවලදී අපි දකින විශේෂත්වය නම් ඕනෑම පුද්ගලයකුගේ කාරුණික බවයි. රෝහලක වුවද පිළිගැනීමේ නිලධාරිනියගේ සිට විශේෂඥ වෛද්‍යවරයා දක්වාද තත්ත්වය එසේමයි. වරක් මොළයේ සී ටී ස්කෑන් පරීක්ෂණයකට ඉදිරිපත්වුණු මගේ මව ඇයගේ හිස යන්ත්‍රයක් තුළට ඇතුළු කළ යුතු වූ නිසා ඒ සඳහා ඕයවු නිසාම ඒ පරීක්ෂණයට පෙනී සිටීම ප්‍රතික්ෂේප කළා. නමුත් කෙසේ හෝ එය කළ යුත්තක්ම වූ නිසා මව සමීපයෙන් හිඳින්නට මගේ සොයුරා හෙදියක ගෙන් අවසර පැතූ අවස්ථාවේ මවගේ මානසික තත්ත්වය හොඳින් වටහා ගත් ඇය, කිසිම පැකිළීමක් නැතිව ඒ සඳහා අවසර දුන් අතර පරීක්ෂණය පැවැත්වුණ විනාඩි 45කට ආසන්න කාලය තුළදී මවගේ හිස යන්ත්‍රය තුළ තිබියදී මගේ සොයුරා ඇය සමීපයන්ම අසුන් ගෙන ඇගේ අතින් අල්වා ගෙන සිටියා. පරීක්ෂණ කාලය අතරතුරදී සොයුරාගේ අත අල්වා ගෙන සිටියදී ඇයට පුදුමාකාර ආරක්ෂාවක් දැණුනු බව මව පසුව පැවසුවේ ලොකු සතුටකින්.

ගිතන්න අපේ රෝහලකදී මෙවන් කාරුණික බවක් අපට අත්විඳින්නට ලැබෙනවා නම් ඒ බොහෝ කලාතුරකින් නොවේද? ඉතා කෙටි නිවාඩුවකට ලංකාවට ගියත් රෝහලකට යන්නට සිදුවුණොත්, මේ සිද්ධීන් ඔබටත් අත්දැකීම් වේවි.

රෝගියකු තමා හමුවීමට රෝහල් කාමරයට ඇතුළු වන විට අසුනෙන් නැගිට රෝගියා ආපසු යනවිට අසුනෙන් නැගිට ඔවුන්ට නිරෝගි සුවය පතමින් ඔවුන්ගේ මනස සැහැල්ලු කරන එකම වෛද්‍යවරයෙක් මා දන්නා තරමට ලංකාවේ සිටින බව කියන්නටත් සතුටට කරුණක්. ඒ, දිනකට සීමිත රෝගීන් ගණනක් සඳහා නවලෝක රෝහලට පමණක් පැමිණෙන වෛද්‍ය වපිරි සේනාරත්නයි. ඇත්තටම වෛද්‍යවරයකුගේ එවන් කරුණික බවක් රෝගියෙකුට දිව ඔසුවක්. තමාගෙන් වෛද්‍ය උපදෙස් පතා එන ඕනෑම රෝගියෙකුට ඔහුගේ සැලකීම එබඳුයි. ඇත්තටම මිල කළ නොහැකි එවන් කාරුණික බවක් සෑම වෛද්‍යවරයෙකු ළඟම නොඅඩුව තිබිය යුතු බව මගේ හැඟීමයි.

නමුත් අපේ දේශීය වෛද්‍යවරුන්ගේ තත්ත්වය මීට වඩා හාත්පසින්ම වෙනස්. හුඟක් සිංහල වෙද මහත්වරුන් වවනයේ පරිසමාප්ථාර්ථයෙන්ම මහත්වරුන් වීම ඔවුන්ගේ මා දුටු විශේෂත්වයයි. ඔවුන්ගේ වෙදකම් සඳහා ගියම කළ මිළක් නැත්තේ මා සිතන පරිදි මුදලට වඩා ඔවුන් රෝගියාගේ යහපතට මුල් තැනක් දී කටයුතු කිරීමයි. ලෝකයේ රටවල් කීපයකට ගියත් බටහිර වෛද්‍ය විද්‍යාවෙන් සුව නොවුණු යන්ත්‍රයකට කැපී වෙන්වුණු අතක් දේශීය වෛද්‍ය විද්‍යාවේ පිහිටෙන් සුවකර දීම වෙනුවෙන් කෘතගුණ සැලකීමක් විදියට මිරිගම ප්‍රදේශයේ නෙළිලිගහමුල නිමල් වෙදමහතා නමින් ප්‍රසිද්ධ දේශීය වෛද්‍යවරයෙකුට සුවය ලැබීමෙන් අනතුරුව ඒ සුදු මහතා විශාල මුදලක් වැයකර එම වෙදගෙදරට වාට්ටු කීපයක් තනාදී එම වෙදමහතාට මාස්පතා ලක්ෂ ගණනින් මුදල් පරිත්‍යාග කරන බව දන්නා අයට රහසක් නොවෙයි. ඒත් එම වෙදමහතා පාන්දර පගේ සිට රාත්‍රී දහය ඉක්මවන තුරුත් කාලය වැය කරන්නේද අත පය කැඩුණු අසරණ රෝගීන් වෙනුවෙන්මයි.

මෙවැනි ඕනෑ තරම් සිද්ධීන් තිබුණත් මෙගිදී අප පවුලේ වෛද්‍යවරයා විසින් කියූ ඔහු ලද අත්දැකීමක් මේ ලිපියේ අවසානය සඳහා එකතු කරන්නට සිතුණා. වරක් ලංකාවට ගිය එම වෛද්‍යවරයා කෙටි නිවාඩුවකට තම මව මෙහි කැඳවාගෙන ඒම සඳහා සියල්ල සූදානම් කිරීමෙන් අනතුරුව එම මවට වීසා අනුමත කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකට යොමු වීම සඳහා ලැබුණු වෛද්‍ය නාමාවලියේ එම වෛද්‍යවරයාගේ මිතුරු වෛද්‍යවරයකුගේ යෙහෙළියක වන වෛද්‍යවරියකගේ නමත් සඳහන්ව තිබුණේලු. අප වෛද්‍යවරයා ලංකාවේ රැඳී සිටින කාලය සීමා සහිත නිසාත්, තමා නැවත ඕස්ට්‍රේලියාවට පැමිණෙන විට මව සමගින්ම ඒමට අදහස් කළ නිසාත් මිතුරු වෛද්‍යවරයාගේ උපදෙස් අනුව ඔහුගේ යහළු වෛද්‍යවරියට මවගේ පරීක්ෂණ කටයුතු භාරදීම සඳහා මුදල් ගෙවා දිනයක්, වෙලාවක් වෙන් කර ගත් අප වෛද්‍යවරයා මව සමගින් එම වෛද්‍යවරිය මුණ ගැසුණේලු. අදය තරමක අහංකාර සිතක් මවාගෙන කටයුතු කරන බව හැඟුණු නිසා ලද අවස්ථාවක් ප්‍රයෝජනයට ගනිමින් තමාත් වෛද්‍යවරයෙකු බව ඇයට කීවේලු. 'ඉතින්?' ඒ ඇගේ පිළිතුරලු. අප වෛද්‍යවරයා කීවේ ඇගේ ඒ පිළිතුරෙන් තමන් ඉතාමත් අපහසුතාවයකට පත්වුණ බවයි. 'ඉතින්? කියනවා වෙනුවට 'දැන ගන්නට ලැබීමත් සතුටක්' කියන්නට තරම් මහත්මා ගතියක් ඇය තුළ තිබුණා නම් කොයි තරම් හොඳද? තමන්ගේම වෘත්තිකයෙකුට වෛද්‍යවරියකගේ සැලකීම එබඳු නම් රෝගීන් වෙත ඇය දක්වන සැලකීම ගැන කුමන කතාද?

දිනෙන් දින පරිහානිය කරා ඇදෙන අපේ මිනිසුන් ගැන මෙහි සිට කතා කරනවා ඇරෙන්නට ඔවුන් වෙනුවෙන් වෙන කළ හැකි යමක් අපිට තියෙනවද? ■

19 වන පිටෙන්

සිටියා ය.

''මට යන්න දෙන්න.. ප්ලීස්..'' ඈ කෙඳිරුවා ය.

''බැහැ.. මට තවත් මේක බලා ඉන්න බැහැ.. ඒක්කෝ ඔයා මා එක්ක ඉන්න ඕනෙ.. නැත්නං..'' ඔහු අතරගම නැවතුණේ ය.

''නැත්නං..?''

''නැත්නං අපි දෙන්ගෙන් එක්කෙනෙක් නැති වෙන්න ඕනෙ.'' ඔහු එය කී ආකාරයට ඈ තිගැස්සුණා ය. සිත් පිත් නැති රූකඩයක් සේ ඔහුගේ ග්‍රහණයට මැදිව සිටි ඇගේ දෑසින් කඳුළක් කඩා වැටුණි. ඔහු ඒ නොදුටුවා සේ ඇගේ මුහුණ තමා වෙතට හරවා ගත්තේ ය. එක දැමයකුදු ඇයට සෙළවෙන්නට ඉඩක් නොතබා ඇගේ දෙතොල් සිප ගත්තේ ය.

''උඹ මගේ ගෑණි.. මේ මගේ අයිතිය..'' ඔහු වියරුවෙන් කෑ ගැසුවේ ය.

''මේක බලහත්කාර කමක්.. '' වැරෙන් සිය මුහුණ ඉවතට ගත් නිෂාධි කෑ ගැසුවා ය. ''.. මම පොලීසියට කතා කරනවා..''

''කතා කරපං.. කතා කරලා පැමිණිලි කරපං.. තමන්ගෙ මිනිහා තමන් එක්ක බලෙන් නිදා ගත්ත ය කියලා පැමිණිල්ලක් දාපං.. බලහත්කාරකම් කළා කියලා මාව හිරේට දාපං.. තව මට ඉතුරුවන්න දෙයක් නෑ.. ඒක උඹේ සැනසීම නම් ඒ ටිකත් කරපං.. ඊට පස්සෙ සැනසීමෙන් හිටපං.. ''

''මේච්චර කාලයක්.. මේච්චර කාලයක් ඔහේට ඕනෙ වුණේ මාව මලක් වගේ ලස්සනට ළඟින් තියාගෙන ඉන්න විතරයි.. ලෝකෙට පේන්න.. ලෝකෙට පේන්න මටත් ලස්සන ගෑණියෙක් ඉන්නවා කියලා..'' නිෂාධි වියරුවෙන් කෑ ගැසුවා ය. ''..ඒ ගෑනිටත් හැඟීම් තියෙනවා කියලා මේච්චර කාලෙකට තමුසෙට දැනුණෙ නෑ.. අද මේ පෙන්නන ඕනෙ කම මේච්චර කාලෙකට කොහෙද තිබුණෙ..? අද ද දැනුණෙ තමුසෙ පිරිමියෙක් කියලා..''

නිෂාධි වැලඟින්නක සේ හඬා වැටුණා ය. ඔහු වැරෙන් ඇය තල්ලු කර දුමුවේ ය. ඈ අප්‍රාණිකව සෝපව මතට ඇද වැටුණා ය. ඔහු වියරු වැටුණොකු සේ ඇය වෙත ආවේ ය. ඔහුගේ ග්‍රහණයට නැවත අසු වන්නට පෙර නිෂාධි පියවි සිහිය ලද්දා ය. අතට අසුවූ වීදුරු මල් බඳුනෙන් සිය මුළු ශක්තිය යොදා ඔහුගේ මුහුණට දමා ගැසුවා ය.

හමා එන මඳනලේ මගේ දුක රැගෙන යන් ඈත දුර ආකාශේ සඟවලා ආයෙ එන් සිහිල් සඳ එළිය මග මගේ සීත සනසවන් වසන්තය දවටලා ගිමන් කල සොරා ගන්

සරඟ මල් පීදෙනා උයන් තෙර පිරි යේ ගහඳුරට සැනසෙනා සිතුවිලි ද වැඩි යේ ගත විඳින වේදනා සීත නොදැන පිනා යේ නුඹ දකින සිහින වැල් පුතු සමඟ සිනා සේ

වීදුරු බඳුන බිඳෙන හඬත් ඔහු බිම ඇද වැටෙන හඬත් තදින් දෙනෙත් පියා ගෙන සිටි ඇයට ඇසුණි.

ළඟන කළාපයට

ගොඩවන්න
www.thisara.com